සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
Department of Divineguma Development

4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல
4th floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය / எனது இல / My No: DDD/HO/MF/05/02/08

ඔබේ අංකය / உமது இல / Your No: ........................

දිනය / திகதி / Date: 2016/06/29

**දිවිනැගුම ප්‍රජා මූල බැංකු ණය වැඩසටහන චක්‍ර ලේඛ අංක 2014/07 ට පළමු එකතුව**

සියළුම දිවිනැගුම ප්‍රජා මූල බැංකු කළමනාකරුවන්,

දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිති කළමනාකරුවන්,

## "දිවිනැගුමට - ගමේ ඉතුරුම්"
## <u>දිවිනැගුම ප්‍රජා මූල බැංකු හා දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිති මගින් ක්‍රියාත්මක ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන</u>

### 1. හැඳින්වීම.

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීමත්, සමඟ දිවිනැගුම ප්‍රජා මූල බැංකු වැඩසටහනෙහි ක්‍රියාත්මක ණය වැඩසටහන යටතේ අළුතින් හඳුන්වාදෙන ණය වැඩසටහන් පිළිබඳ මඟ පෙන්වීමට චක්‍ර ලේඛ 2014/07 මඟින් සිදු කර ඇත.

එම චක්‍ර ලේඛ අනුව, ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී බැංකු/ බැංකු සමිති මට්ටමින් පැනනැගුණු ගැටළු සඳහා අවශ්‍ය වන්නා වූ සංශෝධන ඇතුලත් උපදෙස් මෙන්ම ණය පොලී අනුපාත වෙනස් කිරීම් පිළිබඳ මෙම එකතුව මඟින් ලබාදෙන්නෙමු.

### 2. ණය පොලී අනුපාතයන් වෙනස් කිරීම.

**2.1.** 2016.07.01 දින සිට ලබාදෙන ණය සඳහා වාර්ෂික පොලී අනුපාතය වෙනස් කිරීමට තීරණය කර ඇත. ඒ අනුව ගෘහ ඒකක යටිතල පහසුකම් හා දිවිනැගුම ඉසුර ණය වැඩසටහන් 12% ක් ද, අනිකුත් ණය වැඩසටහන් සඳහා 10% ක් ලෙස පොලී අනුපාත වෙනස් විය යුතුය. දැනට ජීවනෝපාය චක්‍රීය වැඩසටහන යටතේ ලබාදෙන ණය සඳහා පොලී අනුපාත වල දැනට වෙනසක් සිදු නොවේ.

**2.2.** දැනටමත් පිටහිටි ණය සඳහා, ඒ ඒ ගිවිසුම් ගත වාර්ෂික පොලී අනුපාත වල වෙනසක් සිදු නොවේ.

### 3. නව ණය වැඩසටහන් සඳහා ගිණුම් ආරම්භ කිරීම හා කේත අංක ලබාදීම.

3.1. අංක 2014/07 චක්‍රලේඛ සඳහන් නව ණය යෝජනා ක්‍රම සඳහා බැංකු පොදු ලෙජරයේ පහත කේත අංක සහිතව නව ගිණුම් මෙම එකතුව නිකුත් කල දින සිට ආරම්භ කර පවත්වා ගෙන යා යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්
பணிப்பாளர் தலைமையதிபதி
Director General
011-2883802/2872202
Fax-011-2887280
dg@divineguma.gov.lk

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
மேலதிக பணிப்பாளர்தலைமையதிபதி
Additional Director General
011-2871672
Fax-011-2887280
adg@divineguma.gov.lk
anuradhakum@yahoo.com

අධ්‍යක්ෂ (පාලන)
பணிப்பாளர் (நிர்வாகம்)
Director (Administration)
011-2873799
Fax-011-2873996
diradmin@divineguma.gov.lk

ප්‍රධාන ගණකාධිකාරී
பிரதான கணக்காளர்
Chief Accountant
011-2869742
011-2869742
finance@divineguma.gov.lk

කාර්යාලය
அலுவலகம்
Office
011-2872202
**011-2887722** (Hotline)
**Desktop - Ruvini**

| ණය යෝජනා ක්‍රමය | කේත අංකය |
|---|---|
| 1. ලැබිය යුතු - ජීවනෝපාය සංවර්ධන ණය ගිණුම | 3117 |
| 2. ලැබිය යුතු - ගෘහ ඒකක යටිතල පහසුකම් සංවර්ධන ණය ගිණුම | 3118 |
| 3. ලැබිය යුතු - හදිසි ව්‍යාපාරික ණය ගිණුම | 3119 |

3.2. 2014/07 හි ඡේද අංක 06හි සමාජ සංවර්ධන ණය යෝජනා ක්‍රමය මින් ඉදිරියට ගෘහ ඒකක යටිතල පහසුකම් සංවර්ධන ණය යෝජනා ක්‍රමය ලෙස හඳුන්වනු ලබයි.

3.3. සමෘද්ධි බැංකු වැඩසටහන යටතේ ක්‍රියාත්මක ස්වයංරැකියා/ ධීවර/ සත්ත්ව/ කිරුළ සංවර්ධන ණය වැඩසටහන් සියල්ල දිවිනැගුම ප්‍රජාමූල බැංකු ණය වැඩසටහන යටතේ, ජීවනෝපාය සංවර්ධන ණය ලෙස හඳුන්වා දී ඇත. එබැවින් මෙම නව චක්‍රලේඛ එකතුව නිකුත් කිරීමට පෙර, නිකුත් කළ ස්වයං රැකියා/ධීවර/කිරුළ/ මිහිජය/ ජනපුබුදු/ නිවාස ණය වල දැනට පිටහිටි ණය ශේෂයන් පොදු ලෙජරයේ ඒ නමින්ම තවදුරටත් ක්‍රියාත්මක විය යුතුය. එම පිටහිටි ණය ශේෂයන් සම්පූර්ණයෙන් අය වූ පසු, එම ණය ගිණුම් වැසියාම සිදුවේ. අලුතින්ම ලබාදෙන ණය මෙම පැරණි ගිණුම් වල තවදුරටත් සටහන් නොකල යුතුය.

4. දිවිනැගුම දිරිය සවිය හා සහන අරුණ ණය වැඩසටහන් අවලංගු කෙරේ.
5. රටවිරුවෝ නිවාස ණය, රටවිරු ජීවනෝපාය සංවර්ධන ණය වැඩසටහන් අත්හිටුවා ඇත.
6. ගෘහ ඒකක යටිතල පහසුකම් සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ ලබාදෙන, වැසිකිලි පහසුකම් ණය සඳහා උපරිම රු. 25,000 ක් ද, ජල සම්බන්ධතා ලබාදෙන ණය සඳහා උපරිම ණය මුදල රු. 40,000/- ක් ද විය යුතුය.
7. දිවිනැගුම ප්‍රජාමූල බැංකු මගින්, සාමාජිකයින්ට ජීවනෝපාය, වගා ණය වැඩසටහන් යටතේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතාව (ව්‍යාපෘතියේ ස්වභාවය) වෙනුවෙන් රු. 500.000 දක්වා පුද්ගල ඇප 02 මත ණය නිකුත් කල යුතුය.(මෙම එකතුවේ 14.1 ඡේදය බලන්න)
8. දිවිනැගුම ඉසුර ණය වැඩසටහන යටතේ කාරක ප්‍රාග්ධනය හැර අනිකුත් කාරණා වෙනුවෙන් ණය නිකුත් කිරීමට බලය ඇත. (පුද්ගල ඇප සලකා බැලීමේ දී මෙම එකතුවේ 14.1 ඡේදය බලන්න)
9. රටවිරු ජීවනෝපාය ණය වැඩ සටහන, අත්හිටුවා ඇති බැවින්, විදේශ රැකියාවක නියුතු හෝ නියුතු වී සිටි අඩු ආදායම්ලාභින්ගේ පවුල් වලට ආදායම් උත්පාදන ණය ව්‍යාපෘති සඳහා අවශ්‍ය අරමුදල් දැනට ක්‍රියාත්මක ජීවනෝපාය සංවර්ධන වැඩසටහන්/ වගා ණය යටතේ ණය ලබාගත හැක. එහිදී ණය ඉල්ලුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් 2014/07 චක්‍රලේඛ උපදෙස් පරිදි විය යුතුය.

## 10. ණය මුදල් ආපසු අයකර ගැනීමේ කාල සීමාවන්

10.1. 2014/07 හි ඡේද අංක 06 හි උපරිම කාලයන් සඳහන් වුවද, ජීවනෝපාය සංවර්ධන/ වගා/ දිවිනැගුම ඉසුර ණය වැඩසටහන් යටතේ කාරක ප්‍රාග්ධන / වාහන / යන්ත්‍ර සූත්‍ර

ලබාගැනීමට රු.300,000 සිට රු.1,000,000 දක්වා ලබාදෙන ණය මුදල් හි ආපසු අයකර ගැනීමේ කාලය උපරිම මාස 60 ක් වේ.

10.2. වගා ණය වැඩසටහන යටතේ ලබාදෙන ණය මුදල් යොදන ව්‍යාපෘතියේ හෝ වගාවෙහි ඵලදාව/ අස්වැන්න ලැබෙන කාලය සලකා බලා කළමනාකරු විසින් ණය අයඳුම්කරු සමඟ සාකච්ඡා කර ආපසු ගෙවීම මාස/ කන්න යන්න මත තිරණය කිරීමට ඉඩදෙනු ලැබේ. මාස 06 ක් හෝ ඊට අඩු කාලයක් තුල අස්වැන්න ලැබෙන වගා ව්‍යාපෘති සඳහා ලබාදෙන ණය ආපසු ගෙවීමට මාස 06 ක සහන කාලයක් හිමිවන අතර, එහිදී පොලි ගණනය කිරීම සහන කාලය ඇතුලත්ව දින අනුව සිදුවිය යුතුය.

## 11. ණය පැහැර හැරීම්, කල්පසු වූ ණය සඳහා වෙන් කිරීම හා ගිණුම් සටහන් තැබීම.

11.01. බොල් ණය සඳහා ගිණුම් හා කේත අංක ලබාදීම.

| **ණය වර්ගය** | **කේත අංකය** |
|---|---|
| බොල් ණය ගිණුම - ජීවනෝපාය සංවර්ධන | 3219 |
| බොල් ණය ගිණුම - ගෘහ ඒකක යටිතල පහසුකම් සංවර්ධන | 3220 |
| බොල් ණය ගිණුම - හදිසි ව්‍යාපාරික ණය | 3221 |
| බොල් ණය ගිණුම - දිවිනැගුම දිරිය සවිය | 3222 |

අනිකුත් ණය වැඩසටහන් සඳහා බොල් ණය වෙන් කිරීම් සඳහා දැනට පොදු ලෙජරයේ ආරම්භ කර පවත්වාගෙන යන ගිණුම් හා කේත අංක තවදුරටත් නොවෙනස්ව ඉදිරියට පවත්වාගෙන යෑම හා ගිණුම් තැබීම සිදු කළ යුතුය.

12. රු. 500,001 සිට රු. 1,000,000 දක්වා බැංකු සමිති මඟින් ලබාදෙන දිවිනැගුම ඉසුර ණය වැඩසටහන යටතේ, ණය ලබාදීමේදී අදාල ව්‍යාපෘතිය පිළිබඳ ශක්‍යතා වාර්තාව අනුමත කිරීම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ වෙත පැවැරේ.

## 13. විශේෂිත ණය ඉල්ලීම් සම්බන්ධ ශක්‍යතා අධ්‍යයනය හා නිර්දේශ ලබාදීමට විශේෂිත ප්‍රාදේශීය කමිටුවක් පත් කිරීම.

13.1. සුවිශේෂ අවස්ථාවක ණය සංස්කෘතියට හුරු වී ණය පියවර කිහිපයක් / ණය මුදල් කිහිපයක් ලබාගත් සාමාජිකයන්ගේ විශේෂ ඉල්ලීමක් මත ඒ ඒ ණය වල උපරිම ණය සීමාවන් තුල ඉහල ණය මුදලකට යෑමට ඉඩ දිය හැක. එහිදී විශ්වාසනීයත්වය, ආදායම් තත්ත්වය, ව්‍යාපෘතියේ ශක්‍යතාවය, ඇප සුරැකුම් වල විශ්වාසනීයත්වය සලකා ප්‍රජාමූල බැංකුවේ පාලක මණ්ඩලයේ අනුමැතිය යටතේ ණය මුදාහැරීමට ඉඩ ඇත. ඒ සඳහා ව්‍යාපෘතියේ ශක්‍යතාවය සොයා බලා, නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ප්‍රාදේශීය කමිටුවක් පත් කෙරේ.

I. දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිති කළමණාකරු (සභාපති)

II. ව්‍යාපෘති කළමණාකරු (සාමාජික)

III. ණය ඉල්ලුම් පත ඉදිරිපත් කරන බැංකුවේ කළමණාකරු (සාමාජික)

IV. බල ප්‍රදේශයේ වෙනත් දිවිනැගුම ප්‍රජාමූල බැංකුවක කළමණාකරුවෙක්/ මූලස්ථාන කළමණාකරු (සාමාජික)

V. අදාල ණය ඉල්ලීම නිර්දේශ කරන ලද වසමේ දිවිනැගුම සංවර්ධන නිලධාරී (සාමාජික)

කමිටුව මඟින් අදාල ව්‍යාපෘතිය සාකච්ඡා කිරීමේදී, අනිවාර්යයයෙන්ම අදාල බැංකු කළමණාකරු හා බැංකු සමිති කළමණාකරු කමිටුව නියෝජනය කල යුතු අතර, සණ පූර්ණය අවම වශයෙන් 03 ක් සිටිය යුතු වේ. සියළුම වාර්තා කැඳවීම හා වාර්තා තබා ගැනීම බැංකු සමිති කළමණාකරුගේ වගකීමක් වේ. ඉන් අනතුරුව දැනට ක්‍රියාත්මක බැංකු සමිති විධායක කමිටුවට ඉදිරිපත් කර, එකඟතාවය ලබා බැංකු පාලක මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කිරීම කල යුතුය. දිවිනැගුම ඉසුර ණය වැඩසටහන යටතේ මෙවැනි ණය ඉල්ලීම් සලකා බැලීම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ වෙත පැවරේ.
උදා:- යම් සාමාජියකු විසින් රු.100,000 ණය මුදලක් ගෙන, ගිවිසුම්ගතව ණය මුදල ගෙවා අවසන් කර ඇතිවිටක, ව්‍යාපෘතියේ ශක්‍යතාවය, සාර්ථකභාවය මත රු.200,000 හෝ ඊට වැඩි ණය මුදලක් ඉල්ලුම් කිරීම කරන අවස්ථාවක් දැක්විය හැක.

## 14. දිවිනැගුම ප්‍රජා මූල බැංකු/ ප්‍රජා මූල බැංකු සමිති ලබාදෙන ණය මුදල් සඳහා සුරකුම්.

14.1. 2014/07 හි ඡේද අංක 8.5 හි සඳහන් පුද්ගල ඇප ලබාගැනීමේ දී, රාජ්‍ය / අර්ධ රාජ්‍ය/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ පලාත් පාලන ආයතන වල සේවයේ නියුතු ස්ථිර සේවක ඇප පමණක් ලබාගත යුතුය. පෞද්ගලික ආයතන වල සේවක ඇප ලබාගැනීම නොකල යුතුය.

14.2. ගෘහ ඒකක යටිතල පහසුකම් ණය වැඩසටහනේ දී රු. 100,001 සිට රු. 300,000/- දක්වා සියළු ණය මුදල් සඳහා දේපල ඇප ලබාගත යුතුය.

14.3. දිවිනැගුම ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති මඟින්, ආදායම් උත්පාදන ණය යෝජනා ක්‍රම යටතේ වාහන/ යන්ත්‍ර මිලදී ගැනීමේදී, අදාල තක්සේරු/ ඉන්වොයිසි මිලෙන් 80% දක්වා ණය නිකුත් කල යුතුය. ඉඩම් හා ගොඩනැගිලි මිලදී ගැනීමේදී තක්සේරු වටිනාකමින් 100% දක්වා ණය නිකුත් කල හැක.

14.4 දිවිනැගුම ප්‍රජා මූල බැංකු / ප්‍රජා මූල බැංකු සමිති විසින්, සුරකුම් ලෙස ලබාගන්නා චංචල හා නිශ්චල දේපල හා වාහන වල පරම අයිතිය දිවිනැගුම ප්‍රජාමූල බැංකුව නමින් ලියාපදිංචි කල යුතුය.

## 15. ණය ඉල්ලුම් කිරීමේ දී ණය අයදුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු අනිකුත් ලියවිලි.

15.1 චංචල හා නිශ්චල ඇපය ඉදිරිපත් කිරීමේ දී, කිරුළ සංවර්ධන ණය වැඩසටහන/ දිවිනැගුම ඉසුර ණය වැඩසටහනට අදාළ නිකුත් කරන ලද චක්‍රලේඛ වල සඳහන් සුරකුම් වලට අදාල ලියවිලි ඇතුළු අනිකුත් ලියවිලි ලබාගත යුතුය.

15.2 ඉඩම්/ නිවාස/ ව්‍යාපාරික ගොඩනැගිලි මිලදී ගැනීමේ දී විට් රේඛා සහතිකය/ නොපවරා ගැනීමේ සහතිකය ආදිය පළාත් පාලන ආයතන වලින් ලබාගත යුතුය.

15.3 රජයේ නිලධාරී ඇප ලබාගැනීමේ දී, සම්පූර්ණ කලයුතු ලියවිලි,දිවිනැගුම ප්‍රජා මූල බැංකු / බැංකු සමිති විසින් පහත පරිදි ලබාගත යුතුය. ඒ සඳහා මෙහි සඳහන් ඇමුණුම් භාවිත කළ යුතුය.

- i. මාසික වැටුප් විස්තරය, - ඇමුණුම් - 01
- ii. ඇපකරු ප්‍රකාශය, - ඇමුණුම් - 02
- iii. ඇපකරු ගිවිස්නාව, - ඇමුණුම් - 03

15.4 දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිතිය මඟින් ක්‍රියාත්මක කරන දිවිනැගුම ඉසුර ණය වැඩසටහන සඳහා, මෙහි ඇමුණුම් වල ඇති සංශෝධිත අයදුම් පත්, ගිවිසුම් හා අනිකුත් ලියවිලි භාවිතා කළ යුතුය.

- i. දිවිනැගුම ඉසුර ණය අයදුම් පත්‍රය - ඇමුණුම් - 04
- ii. තත්ත්ව විස්තරය - ඇමුණුම් - 05
- iii. ව්‍යාපෘති ඇගයීම් වාර්තාව - ඇමුණුම් - 06
- iv. ප්‍රජා මූල බැංකු සමිතිය ලබාගත් ලියවිලි පිළිබඳ සංක්ෂිප්ත වාර්තාව - ඇමුණුම් - 07
- v. පිළියෙදුම් මුල් ණය සීමා ගිවිසුම් - ඇමුණුම් - 08
- vi ප්‍රතිමූල්‍ය ණය අයදුම් කිරීමේ පත්‍රය - ඇමුණුම් - 09
- vii ණය ගිවිසුම් පත්‍රය - ඇමුණුම් - 10

16. දිවිනැගුම චක්‍රලේඛ 2014/07 හි ඡේද අංක 8.9 හි සඳහන් ධන ආයෝජන ගිණුමක් පවත්වාගෙන යෑමේ කොන්දේසිය අවලංගු කරනු ලැබේ. ණය මුදලක් ලබාගැනීම සඳහා මෙම උපදෙස ආරම්භයේ සිට අවලංගු කරන බව තවදුරටත් දන්වමු.

17. **ණය සංරක්ෂණ හා සමූහ සංරක්ෂණ අරමුදලට දායකවීම.**

17.1. 2014/07 හි ඡේද අංක 8.11 ණය සංරක්ෂණ දායකත්වය මෙමඟින් සංශෝධනය කෙරේ. ඒ අනුව රු. 75,001 සිට රු. 500,000 දක්වා මුදාහරින ණය වලදී, ණයකරුගෙන් 1%ක් ද, බැංකුවේ දායකත්වය 1% ක් ද වශයෙන් චක්‍රලේඛය නිකුත් කල දින සිට සංශෝධනය කෙරේ.

17.2. ණය සංරක්ෂණයේ දී ණයකරුගෙන් අයකරගන්නා දායක මුදල ණය සංරක්ෂණ අරමුදල් ගිණුමට (4034) රැස්කල යුතුය.

17.3. දිවිනැගුම වගා ණය වැඩසටහන යටතේ, කන්න බෝග/ කෙටි කාලීන බෝග යන වගාවන් වෙනුවෙන් ලබාදෙන රු.100,000/- දක්වා ණය සඳහා ණය මුදලින් 2% ක මුදලක් ණය සංරක්ෂණ අරමුදල දායක කරගත යුතුය. නමුත් ඉහත වගාවන් සඳහා වුවද, රු.100,001/- සිට ඉහළ ණය මුදල් සඳහා ඉහත 17.1 හි පරිදි දායක මුදල් ලබාගත යුතුය. නමුත් දිවිනැගුම වගා ණය වැඩසටහන යටතේ රු.500,000/- දක්වා කෘෂිකාර්මික ව්‍යාපෘති වෙනුවෙන් මිලදී ගන්නා යන්ත්‍ර සූත්‍ර/ උපකරණ/ වාහන මෙන්ම, විසිතුරු පැල, සුළු අපනයන බෝග, පළතුරු ඇතුළු දීර්ඝ කාලීන වගාවන්

සඳහා ලබාදෙන ව්‍යාපෘති ණය සඳහා ඉහත 17.1 සඳහන් පරිදි සියළුම මුදල් සඳහා ණය සංරක්ෂණ අරමුදලට දායක කර ගැනීම අනිවාර්ය වේ.

17.4 දිවිනැගුම ඉසුර ණය වැඩසටහ යටතේ ලබාදෙන සියළු ණය සඳහා දිවිනැගුම ඉසුර ණය උපදෙස් හී ඡේද අංක 13.0 හි සඳහන් පරිදි රක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කළ යුතුය.

17.5 චක්‍රලේඛ අංක 2014/07 හි ඡේද අංක 8.11 සමූහ රක්ෂණ දායකත්ව අනුපාතයන් නොවෙනස්වන අතර, නමුත් සමූහ සංරක්ෂණ අරමුදලට දායකත්වය දරණ නව ණය මුදලක් ලබාගැනීමේ දී මීට පෙර එම වර්ගයේ ණය මුදලක් ලබාගෙන සමූහ සංරක්ෂණ අරමුදල දායක වූ දායකත්ව මුදල අඩුකර, ඉතිරිය ලබගැනීම කල යුතුය.

උදා :- රු. 100,000/- ස්වයං රැකියා ණය මුදලක් ලබාගෙන, සම්පූර්ණයෙන් ගෙවා අවසන් කර රු. 150,000/- ණය මුදලක් ලබාගැනීමට ඉල්ලුම් කිරීමේ දී සමූහ සංරක්ෂණ දායක මුදල රු. 3,000/- කි. නමුත් මීට පෙර ලබාගත් රු. 100,000/- ක ණය මුදල සඳහා සමූහ සංරක්ෂණ දායක මුදල වූ රු. 2,000/- අඩුකර නව ණය මුදලය ගෙවිය යුතු සමූහ සංරක්ෂණ මුදල වනුයේ රු. 1,000/- කි.

18. රු. 50,001 සිට ඉහල ණය ඉල්ලීම් වලට අදාල ව්‍යාපෘති වාර්තා සකස් කිරිමේ වගකීම ව්‍යාපෘති කළමනාකරු / ව්‍යාපෘති සහකාර විසින් සිදුකල යුතුය. මෙම කාර්යය අධීක්ෂණය බැංකු සමිති කළමනාකරුට පැවරේ.

19. දිවිනැගුම ප්‍රජාමූල බැංකු විසින් ක්‍රියාත්මක කරන සියළුම ණය වැඩසටහන් වලදී, තනි පුද්ගල ණය සඳහා S3 - II ද බද්ධ ණය නිකුත් කිරීමේ දී S3 - I ද යන ණය ගිවිසුම් පත්‍ර දී ඇති උපදෙස් පරිදි තවදුරටත් නොවෙනස්ව ක්‍රියාත්මක වේ. එමෙන්ම ණය ඉල්ලුම් කිරීමේ අයදුම් පත්‍රය ද දැනට හඳුන්වා දී ඇති ආකෘතිය තවදුරටත් ප්‍රජාමූල බැංකුව විසින් භාවිතා කළ යුතුය. (පුද්ගල ඇප යටතේ ණය මුදල් ලබාදීමේ දී, මෙම ගිවිසුම් පත්‍රය වලංගු කරගත යුතුය.)

20. මෙම එකතුවේ සඳහන් නොවන අනෙකුත් උපදෙස් 2014/07 හි සඳහන් පරිදි වලංගු කරගත යුතුය.

**සුනන්දා පියසීලි,**
**අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය).**

**අත්සන් කලේ, චන්ද්‍රා වික්‍රමසිංහ,**
**අධ්‍යක්ෂ ජනරාල්.**

**පිටපත් :-**

| | | | |
|---|---|---|---|
| 01. | ලේකම්, සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය | - | කා.දැ.ස. |
| 02. | සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් | - | කා.දැ.ස. |
| 03. | සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් | - | කා.දැ.ස. |
| 04. | සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන් | - | කා.දැ.ස. |
| 05. | ප්‍රධාන අභ්‍යන්තර විගණක, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව | - | කා.දැ.ස |